# DFCC Pay (ඩී.එෆ්.සී.සී. පේ) නියමයන් හා කොන්දේසි

**පහතින් ඇති "මම එකඟ වෙමි" බොත්තම එබීමෙන්, ගනුදෙනුකරු විසින් පහත සඳහන් පරිදි එකඟ වී සනාථ කරනු ඇත:**

**ඩී.එෆ්.සී.සී. පේ සේවාවට අදාල විස්තර ඇතුලුව, පහත සඳහන් නියමයන් හා කොන්දේසි ගනුදෙනුකරු හට පහදා දුන් අතර ගනුදෙනුකරු විසින් එම විස්තර, නියමයන් හා කොන්දේසි කියවා තේරුම්ගෙන, එම විස්තර, නියමයන් හා කොන්දේසි වලට එකඟවී බැඳී සිටීමට එකඟ වෙයි.**

## 1. අර්ථ දැක්වීම්

වෙනත් යැයි නියම වශයෙන් සඳහන් කර ඇති විට හැරෙන්නට, මෙම ලියවිල්ලේ සහ ඩී.එෆ්.සී.සී. පේ පහසුකමට අදාලව:

**ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය (mobile application)-** යනුවෙන් අදහස් කරන්නේ App Store (ඇප් ස්ටෝර්) හෝ Play Store (ප්ලේ ස්ටෝර්) හරහා බාගත හැකි ඩී.එෆ්.සී.සී. පේ පහසුකම සඳහා වූ **ජංගම** යෙදුම් මෘදුකාංගයයි.

**ගනුදෙනුකරු -** යනුවෙන් අදහස් කරන්නේ ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය බාගත කොට ස්ථාපනය කිරීමත් සමඟ මෙම නියමයන් හා කොන්දේසි වලට එකඟවෙමින් ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය හරහා ලැබෙන සේවා අංග භාවිත කරන පුද්ගලයකු වේ.

**වෙළෙන්දා -** යනුවෙන් අදහස් කරන්නේ භාණ්ඩ සහ/හෝ සේවා සපයන්නෙක් DFCC බැංකුව සමඟ ලියාපදිංචි වී තම වෙළඳ කටයුතු සඳහා ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය හරහා ලැබෙන සේවා අංග භාවිතා කිරීමේදීය.

**QR සංකේතය (QR Code) -** යනුවෙන් අදහස් කරන්නේ QR වෙළෙන්දා හඳුනාගැනීම පිණිස බැංකුව විසින් උපදවන ලද, එකිනෙකට අනන්‍ය ද්විමාන තීරු සංකේතය (Bar Code) එක වේ.

**QR ගනුදෙනුව -** යන්නෙහි තේරුම වන්නේ QR සංකේතය හරහා QR සේවාව භාවිතා කරන වෙළෙන්දෙකු වෙත කරන ලද ගනුදෙනුවකි.

**ගෙවීම් සඳහා ස්කෑන් කරන්න -** මෙයින් අදහස් කරන්නේ වෙළෙන්දාගේ විස්තර රැගත් QR සංකේතය ගනුදෙනුකරු විසින් ස්කෑන් කර, අවශ්‍යනම් ගනුදෙනුවේ අගය ඇතුලත් කර, තහවුරු කිරීමයි.

**හැඳුනුම් නාමය -** ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය පරිශීලනය සඳහා ගනුදෙනුකරු විසින් ලියාපදිංචි කර ඇති නම/පිවිසුම් විස්තර.

**පුද්ගල හැඳුනුම් අංකය (PIN)** – යනුවෙන් අදහස් කරන්නේ QR මෘදුකාංගයට පිවිසීම සඳහා භාවිතා කරන පුද්ගල හැඳුනුම් අංකයයි.

DFCC බැංකුව PLC – 2007 අංක 7 යන සමාගම් පනතට යටත්ව ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කෝපරේශන් ඔෆ් සිලෝන්, DFCC බැංකුව PLC යන නමින් සංස්ථාගත කරන ලදී.

## 2. ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය

ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය නිර්මාණය කර ඇත්තේ ගනුදෙනුකරු හට තෝරාගත් කාඩ් යෝජනා ක්‍රමයකින්, ගිණුමකින්, වෙනත් ගෙවීම් ක්‍රමයකින්, සැපයුම්කරුවකුගෙන්, එක්රැස් කරන්නෙකුගෙන් යනාදී මූලාශ්‍රයකින් කෙලින්ම ජංගම දුරකථනයක් මගින් QR ගෙවීම් කිරීමට හැකියාව සැලසෙන ආකාරයටයි.

QR ගෙවීම් පහසුකම සඳහා කාඩ් ගනුදෙනු වලට මෙන් විද්‍යුත් දත්ත රැස් කිරීමේ මෙවලම් අවශ්‍ය වන්නේ නැත. ඒ වෙනුවට වෙළෙන්දා සතුව ජංගම දත්ත සබඳතාවයක් සහිත ස්ථිතික හෝ ගතික QR සංකේතයක් උපදවන උපකරණයක් තිබෙනු ඇත.

බැංකුව විසින් පාරිභෝගිකයාට සපයන QR සේවාව සහ පාරිභෝගිකයා විසින් එම සේවාව පරිශීලනය මෙම ඩී.එෆ්.සී.සී. පේ ගිවිසුමෙහි සඳහන් නියමයන් සහ කොන්දේසි යටතේ බල පැවැත්වේ. QR ඔස්සේ ගනුදෙනු කිරීම පිලිබඳ වැඩි විස්තර සඳහා පාරිභෝගිකයින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න. එසේත් නැත්නම් බැංකුවේ වෙබ් අඩවියට www.dfcc.lk ඔස්සේ පිවිසෙන්න. මෙම නියමයන් සහ කොන්දේසි වලට අදාළ සංශෝධනයන් එම වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන අතර, පාරිභෝගිකයාට විද්‍යුත් පණිවිඩයක් මගින්ද දැනුම් දෙනු ඇත.

## 3. ඩී.එෆ්.සී.සී. පේ ආරම්භ කිරීම

මෙම සේවාව භාවිතය ආරම්භ කිරීමට:

a) ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය Play Store (ප්ලේ ස්ටෝර්) හෝ App Store (ඇප් ස්ටෝර්) වලින් බාගත කරන්න.

b) පරිශීලකයකු තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත අංකය සහ ජංගම දුරකථන අංකය යොදන්න. එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදය ඇතුලත් කරන්න.

c) තහවුරු කර ගැනීම සාර්ථක වූ පසු හැඳුනුම් නාමයක් සහ පුද්ගල හැඳුනුම් අංකයක් (PIN) ඇතුලත් කර ඔබගේ පරිශීලක ගිණුම නිර්මාණය කරන්න.

d) මෙම සේවාවට පිවිසීම සඳහා, ප්‍රථමයෙන්ම පුද්ගල හැඳුනුම් අංකය භාවිතා කර ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය සක්‍රිය කළ යුතුය.

e) කාඩ්පතක් හෝ ගිණුමක් එක් කර ගැනීමට කාඩ්පතෙහි ඡායාරූපයක් ස්කෑන් කරන්න, එසේත් නැත්නම් කාඩ්පතෙහි අංකය හෝ ගිණුම් අංකය ඇතුලත් කරන්න.

**සැ.යු.:** ඩී.එෆ්.සී.සී. පේ ගිණුම නිර්මාණය කිරීමට භාවිතා කළ ජංගම දුරකථන අංකය සහ කාඩ්පත/බැංකු ගිණුම සඳහා බැංකුවේ ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකය අතර වෙනසක් ඇති නම්, කාඩ්පත/බැංකු ගිණුමට සම්බන්ධ ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය ඔස්සේ කරන්නාවූ සියලු ක්‍රියාකාරකම් වල තොරතුරු කාඩ්පත/බැංකු ගිණුම සඳහා බැංකුවේ ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකයට පමණක් යවනු ලැබේ.

**4. ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංග පරිශීලකයකු වීම සඳහා අවශ්‍යතා**

a) වයස 18ට වැඩි, ශ්‍රීලාංකාවේ පදිංචිකරුවකු වීම

b) ගැලපෙන මෙහෙයුම් පද්ධතියක් සහිත ජංගම දුරකථනයක් සතු වීම

c) ශ්‍රී ලාංකාවේ සුදුසු ජංගම දුරකථන සම්බන්ධතාවක් සතු වීම

d) ශ්‍රී ලාංකාවේ විවෘත කළ සහ ක්‍රියාත්මක වන කාඩ්පතක් සහ බැංකු ගිණුමක්

**5. පාරිභෝගිකයාගේ ප්‍රතිඥාව**

**a)** තමාගේ ප්‍රවේශවීමේ තොරතුරු රහසිගතව තබා ගැනීම සහ ඔහුගේ/ඇයගේ ණය කාඩ්පත, බැංකු ගිණුම හෝ QR සේවාව ඔස්සේ ඇති වෙනත් ගෙවීමේ ක්‍රම වංචනික හෝ අවසර නොලත් භාවිතයෙන් වළක්වා ගැනීම පාරිභෝගිකයා සතු වගකීමකි. තවද QR සේවාව භාවිතාකර කරන්නාවූ සෑම QR ගනුදෙනුවකම නිරවද්‍යතාවය සහතික කරගැනීම පාරිභෝගිකයාගේ වගකීමකි.

**b)** ජංගම දුරකථනය නැතිවූ අවස්ථාවකදී සහ/හෝ පාරිභෝගිකයාගේ ගිණුමෙහි රහසිගතභාවය සහ සුරක්ෂිතභාවය කඩ වූ විට හෝ එසේ වීමට අවකාශයක් ඇති විට, එය සැණෙකින් බැංකුවේ අවධානයට ගෙන ඒම පාරිභෝගිකයාගේ හුදු වගකීම වනු ඇත. එවැන්නක් සිදුවූ විගසම එය දැනුම්දීම සඳහා පාරිභෝගිකයා විසින් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය යුතු අතර බැංකුව විසින් එය නිවැරදි කිරීමට හෝ වෙනත් ආකාරයකට එම ගැටලුව නිරාකරණය කිරීම සඳහා පාරිභෝගිකයා හට ලබාදෙන්නාවූ සියලු උපදෙස් අනුගමනය කළ යුතුවේ.

**c)** බැංකුවට තමන්ගේ විද්‍යුත් අලෙවිකරණ පණිවිඩ ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගයේ ප්‍රදර්ශනය කිරීමට සහ වරින් වර කෙටි පණිවුඩ ප්‍රවර්ධනයන් කිරීමට අයිතිය ඇත.

**d)** හැඳුනුම් නාමය, රහස්‍ය අංකය, මුරපදය, එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුරපදය (OTP), හරපත්/බැරපත් ආදියෙන් තහවුරු කළ වෙළෙඳ ස්ථාන, ඇප් ස්ටෝර් (app stores), වෙබ් අඩවි, කිසියම් යන්ත්‍රයක හෝ උපකරණයක් ඔස්සේ කරන්නාවූ ගනුදෙනු සඳහා වූ උපදෙස් බැංකුව විසින් නැවත සත්‍යායනය නොකරන අතර එසේ ලැබුනු උපදෙස් ක්‍රියාත්මක කිරීම පිළිබඳව බැංකුව වග කියනු නොලැබේ.

**e)** ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය අන්තර් ක්‍රියාකාරී බැවින් පාරිභෝගිකයින්ට ජංගම යෙදුම් මෘදුකාංගය ඔස්සේ ගනුදෙනු කිරීම සඳහා ඕනෑම දේශීය කාඩ්පත් නිකුත්කරන්නන්/බැංකු/වෙනත් ආයතන වල කාඩ්පත් හෝ බැංකු ගිණුම් එයට සම්බන්ධ කළ හැකිය. ඩී.එෆ්.සී.සී. කාඩ්පත් සහ බැංකු ගිණුම් හැර, අන් සියලු ආරවුල් පාරිභෝගිකයා විසින් අදාල කාඩ්පත් නිකුත්කරන්නන්/බැංකු/වෙනත් ආයතන වලට වාර්තා කළ යුතුවේ.

**f)** පාරිභෝගිකයා විසින් ඩී.එෆ්.සී.සී. පේ ගිණුම භාවිතා කර ගනුදෙනු කිරීම උදෙසා තම ඩී.එෆ්.සී.සී. පේ ගිණුමට කාඩ්පතක්/බැංකු ගිණුමක් නම් කර සම්බන්ධ කිරීමට එකඟ වෙයි. එම කාඩ්පත සහ/හෝ

බැංකු ගිණුම විවෘත කිරීමේදී පාරිභෝගිකයාට ඔහුගේ/ඇයගේ බැංකුව විසින් ලබාදී ඇති මෙහෙයුම් උපදෙස් පාරිභෝගිකයාගේ ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගය හරහා කරන ගනුදෙනු සඳහා ගිණුම හර කරන විට උල්ලංඝනය විය හැකිය. පාරිභෝගිකයා විසින් මේ සඳහා වගකීම බාර ගැනීමට එකඟ වෙයි.

**g)** ඩී.එෆ්.සී.සී. පේ ගනුදෙනු සඳහා සීමා නියම කිරීමට බැංකුවට අයිතියක් ඇත.

## 6. අසාමාන්‍ය සිදුවීම් වාර්තා කිරීම

a) තමන් භාවිතා කරන ඉලෙක්ට්‍රොනික උපකරණ නැතිවූ විට, සොරකම්වූ විට හෝ අවභාවිතවූ විට පාරිභෝගිකයා එය සැණෙකින් බැංකුවට වාර්තා කළ යුතුවේ.

b) පාරිභෝගිකයා විසින් ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංගයට ප්‍රවේශ වීම සඳහා භාවිතා කරන කාඩ්පත, බැංකු ගිණුම, ජංගම යෙදුම් මෘදුකාංගය හෝ ඉලෙක්ට්‍රොනික උපකරණ වලට අනවසර ප්‍රවේශ වීමක් සිදුවූ විට.

c) තෙවැනි පාර්ශවයක් විසින් පාරිභෝගිකයාගේ හැඳුනුම් නාමය සහ මුරපදය දැනගත් විට.

## 7. උපදෙස් සහ තහවුරු කිරීම්

පාරිභෝගිකයා විසින් බැංකුවට එවන කිසියම් හෝ උපදෙස් බැංකුවට ලැබුණ ලෙස සලකනුයේ එම ඉල්ලීම බැංකුවේ බලයලත් නිලධාරියෙකුට පෙර නියමිත පරිදි ලැබී, එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුවට සාධාරණ කාල සීමාවක් ලැබුණු විට පමණි.

ඩී.එෆ්.සී.සී. පේ ගිණුමක් අවහිර කිරීම, වෙනස් කිරීම හෝ නැවත ක්‍රියාත්මක කිරීම සඳහා ලැබුණාවූ උපදෙස් ක්‍රියාත්මක වනුයේ එම උපදෙස් බැංකුව විසින් සත්‍යායනය කරගැනීමෙන් අනතුරුවය.

## 8. ආරවුල් නිරාකරණය

ඩී.එෆ්.සී.සී. පේ සේවාව සම්බන්ධයෙන් ආරවුලක් ඇතිවූ අවස්ථාවකදී, පාරිභෝගිකයා විසින් ඔහුගේ හෝ ඇයගේ කාඩ්පත නිකුත් කරන ලද බැංකුවට හෝ ගිණුම පවත්වාගෙන යන බැංකුව/මූල්‍ය ආයතනය/වෙනත් ආයතනයන් හට ඒ පිළිබඳව දැනුම් දිය යුතුය.

ඩී.එෆ්.සී.සී. කාඩ්පත්හිමිකරුවන් සහ බැංකු ගිණුම්හිමිකරුවන් සඳහා, බැංකුව විසින් එම ආරවුල් සෑම ගෙවීමේ ක්‍රමයකට/කාඩ්පත්හිමිකාර ගිවිසුමකට අදාළ නීති වලට අනුකූලව නිරාකරණය කිරීම සඳහා තම ඉහළම ප්‍රයත්නය යොදනු ඇත.

QR සේවාව භාවිතා කර වෙළෙන්දා විසින් පාරිභෝගිකයාට සපයන භාණ්ඩ හෝ සේවාවන් වල ඇති කිසියම් දෝෂයන් හෝ අඩුපාඩු වලට බැංකුව විසින් වග කියනු නොලැබේ.

QR සේවාව ක්‍රියාත්මක වීම හෝ ක්‍රියාත්මක නොවීම නිසා ඇතිවූ කිසියම් හෝ අලාභ, හානි, ගාස්තු සහ/හෝ වියදම්, QR සේවාව ඔස්සේ ගනුදෙනුවක් කිරීමට ඇතිවූ ප්‍රමාදයන් හෝ නොහැකි වීම් හෝ QR

සේවාව භාවිතා කිරීම හේතුවෙන් ඔබට අත්විදීමට සිදුවූ අනෙකුත් අලාභ, තුවාළ හෝ අපහසුතා සඳහා බැංකුව විසින් වග කියනු නොලැබේ.

**9. අවසන් කිරීම**

a) පාරිභෝගිකයා විසින් ඩී.එෆ්.සී.සී. පේ ජංගම යෙදුම් මෘදුකාංග ගිණුම භාවිතය කිසියම් හෝ හේතුවක් මත අවසන් කිරීමට අවශ්‍ය නම් එය ලිඛිතව බැංකුවට දැනුම් දිය යුතුවේ. ගිණුම අවසන් කිරීමට ප්‍රථමයෙන් අදාළ ගාස්තු හෝ අය කිරීම් සහ අතිරිත ගනුදෙනු ආදිය ගෙවිය යුතුවේ.

b) බුද්ධික හේතුන් සඳහා තොරතුරු විමසීමකින් තොරව, තමන්ගේ අභිමතයට අනුව ගිණුම අවසන් කිරීමට, අත්හිටුවීමට හෝ ගිණුමට සීමාවන් පැනවීමට බැංකුවට අයිතියක් ඇත.

කරුණාකර අපගේ 24 පැය ඇමතුම් මධ්‍යස්ථානය +94(11)2350000 ඔස්සේ හෝ info@dfccbank.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ අප අමතන්න.

**මෙහි සඳහන් නියමන් සහ කොන්දේසි කියවා තේරුම්ගෙන එයට එකඟවී සැමවිටම බැඳී සිටීමට මම එකඟ වෙමි.**

**එකඟ වෙමි** **එකඟ නොවෙමි**